**ශීර්ෂය 225 - ශ්‍රී ලංකා පොලීසිය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 225 - ශ්‍රී ලංකා පොලීසියේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත්, මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා පොලීසියේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා පොලීසියට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 ජුනි 25 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා පොලීසියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී .ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා පොලීසිය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතු ය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උපවගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා පොලීසියේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස්කර පවත්වාගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කළ සමාලෝචනයක් සිදුකර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු ය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම්කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසාවන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

**(අ) පුනරාවර්තන වියදම්**

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ පුනරාවර්තන වියදම් ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩුව නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රහූ ආරක්ෂක කොට්ඨාශයේ 2023 ඔක්තෝබර් මස සහ දෙසැම්බර් මස ගෙවීම් කරන ලද එකතුව රු.564,990 ක අතිකාල ගෙවීම් එම මාසයන්හි මුදලින් ගෙවීම් කර තිබුණ ද, විගණිත දිනය වන විටත් සිගාස් වැඩසටහනට ඇතුළත් වී නොතිබුණි. ඒ හේතුවෙන් ශ්‍රී ලංකා පොලීසියේ 2023 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂයට හා අතිකාල හා නිවාඩු දින වැටුප් වැය විෂයයට ද මෙම ශේෂය ඇතුළත් වී නොතිබුණි. | 2024 මැයි මස රු.527,520 ද 2024 ජනවාරි මස රු.37,470 ද ගිණුම්ගත කර ඇත. ඉදිරියේදී මෙවැනි සිදුවීම් ඇති නොවීමට වගබලා ගන්නා ලෙස මෙම කොට්ඨාශය දැනුවත් කර ඇති බව දන්වා ඇත. | රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ ප්‍රකාරව ගිණුම් නිවැරදිව පිළියෙල කිරීමට කටයුතු කළ යුතු ය. |

**(ආ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් පාලන ගිණුම අනුව 2023 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.820,083,191 ක් වූ අතර, එදිනට කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ මුළු එකතුව රු.741,315,718 ක් විය. ඒ අනුව රු.78,767,473 ක වෙනසක් නිරීක්ෂණය විය. එම වෙනස හඳුනාගෙන අවශ්‍ය ගැලපීම් කිරීමට කටයුතු කර නොතිබුණි. | 2024 මාර්තු මස 31 දිනට එම වෙනස රු.78,354,092 දක්වා රු.413,380 කින් අඩු කරගැනීමට කටයුතු කර ඇති බව දන්වා ඇත. | වෙනස්කම් හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| (ii) | මූල්‍ය ප්‍රකාශනයේ ඒසීඒ 5 - 2023 දෙසැම්බර් 31 දිනට අත්තිකාරම් ගිණුම් පිළිබඳ ප්‍රකාශනයේ දෙපාර්තමේන්තු පොත් අනුව අත්තිකාරම් ශේෂය රු.820,083,191 ක් ද, භාණ්ඩාගාර පොත් අනුව අත්තිකාරම් ශේෂය රු.819,868,392 ක් ද වූයෙන් රු.214,799 ක වෙනසක් විය. | එම වෙනසට හේතු ලෙස වෙනත් ආයතන විසින් සිදු කර ඇති වැරදි හර හා බැර කිරීම් බවත් ගිණුම් සාරාංශය මගින් නිවැරදි කිරීමට කටයුතු කරන ලෙස දන්වා ඇති බවත් දන්වා ඇත. | වෙනස්කම් හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කළ යුතු ය. |

**(ඇ) දේපළ පිරියත හා උපකරණ**

දේපළ පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩුව අනාවරණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ACA – 6 ආකෘතියට අනුව මූල්‍ය නොවන වත්කම් ශේෂය රු.140,765,756,448 ක් වුව ද, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ දේපළ, පිරියත හා උපකරණ වටිනාකම තුළ අස්පෘශ්‍ය වත්කම් වටිනාකම ඇතුළත් නොවීම නිසා රු.140,638,451,745 ක් ලෙස දක්වා තිබූ අතර ශේෂ දෙක අතර වෙනස රු.127,304,703 ක් විය. | මූල්‍ය නොවන වත්කම් යටතේ දක්වා ඇත්තේ දේපළ පිරියත හා උපකරණ පමණක් බැවින් මෙම අස්පෘෂ්‍ය වත්කම් වටිනාකම මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ ඇතුළත් කර නොමැත. කෙසේ වෙතත් ඉදිරියේදී මෙම වටිනාකම ද දේපළ පිරිවැය හා උපකරණ යටතේ ඇතුළත් කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | වෙනස්කම් හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කළ යුතු ය. |

**(ඈ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

ශ්‍රී ලංකා පොලීසිය විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණනයේදී නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(i) ස්ථාවර වත්කම් ලේඛනය**<br>2023 නොවැම්බර් 30 දිනැති අංක 2023/05 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 8.1 ඡේදය ප්‍රකාරව සිගාස් වැඩසටහන තුළ ස්ථාවර වත්කම් මොඩියුලය මගින් පොලිස් කොට්ඨාශ වාර්තා ඒකාබද්ධකර ස්ථාවර වත්කම් ලේඛනයක් පිළියෙලකර පවත්වා ගෙන ගොස් නොතිබුණි. | කොට්ඨාශ ඒකාබද්ධ කර වත්කම් ලේඛන නඩත්තු කිරීම සඳහා පොලිසියේ දේපළ කළමනාකරණ කොට්ඨාශය වෙත පවරා ඇති අතර, එමගින් ඉදිරියේදී මෙම කටයුතු ඉටු කිරීමට අපේක්ෂා කරන බව දන්වා ඇත. | සිගාස් වැඩසටහන තුළ ස්ථාවර වත්කම් මොඩියුලය මගින් ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගත යුතු වීම. |

**(ii)** **බැරකම් පිළිබඳ ලේඛනය**

| | | |
|---|---|---|
| මුදල් රෙගුලාසි 214 පරිදි බැරකම් සම්බන්ධයෙන් විධිමත් පරිදි පිළියෙල කරන ලද බැරකම් ලේඛනයක් පිළියෙල කර පවත්වා ගෙන ගොස් නොතිබුණි. | 2023.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද අවසාන මූල්‍ය ප්‍රකාශනවල ශ්‍රී ලංකා පොලිසියේ විවිධ කොට්ඨාශයන් විසින් වාර්තා කරන ලද බැරකම් පිළිබඳ ලේඛනය ඇතුළත් කර ඇති බව දැනුම්දී ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව විධිමත් පරිදි බැරකම් ලේඛනයක් පවත්වාගත යුතු ය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 225-1-1-0-2505 - ප්‍රසම්පාදන පෙර සූදානම් වීම හා 225-1-1-0-2509 - සුනඛයින් මිලදී ගැනීම යන වැය විෂයයන් දෙක සඳහා වෙන්කර තිබූ ප්‍රතිපාදන එකතුව රු.60,000,000 ක් අදාළ කාර්යය සඳහා උපයෝජනය නොකර වෙනත් වැය විෂයයන්ට මාරුකර තිබුණි. | ඉදිකිරීම් සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය හා සේවාවන්හි මිළ ගණන් සීඝ්‍රයෙන් ඉහළ යාම, මිළ ගණන් ඉදිරිපත් නොකිරීම සහ නීතිමය ගැටළු හේතුවෙන් 2505 වැය විෂයයේ ද සුනඛයන් මිලදී ගැනීමට මිළ ගණන් කැඳවූව ද, නීතිමය බාධා මතුවීම මත 2509 වැය විෂයයේද ප්‍රතිපාදන ඉතිරිය වෙනත් වැය විෂයයන්ට මාරු කිරීමට සිදු විය. | නිසි අධ්‍යනයකින් යුතුව ප්‍රතිපාදන වෙන්කර ගැනීමට වගබලා ගත යුතු ය. |
| (ආ) | 2023 වර්ෂයේදී වැය විෂයයන් හතරක් සඳහා ප්‍රතිපාදිත රු.87,000,000 කින් රු.56,024,232 ක් ඉතිරි වී තිබුණු අතර, එම ඉතිරිය සියයට 49 සිට සියයට 100 ක් දක්වා පරාසයක විහිදී තිබුණි. | කොන්ත්‍රාත්කරුවන් විසින් මිළ ගණන් ඉදිරිපත් නොකිරීමත්, වෙනත් නෛතික කරුණුත්, වෙළඳපළ මිළ ඉහළයාම හේතුවෙන් මෘදුකාංග සංවර්ධන කටයුතු සිදු නොකිරීමත්, නිසි කාල වකවානු තුළ කටයුතු අවසන් නොකිරීමත් යන හේතු මත ප්‍රතිපාදන ඉතිරි වූ බව දන්වා ඇත. | නිසි අධ්‍යනයකින් යුතුව ප්‍රතිපාදන වෙන්කර ගැනිමට වගබලා ගත යුතු ය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2023 ජනවාරි 27 දිනැති අයවැය චක්‍රලේඛ අංක 01/2023 ප්‍රකාරව 1001, 1204, 1404, 1502, 1601, 1602 හා 1603 හැර අනෙකුත් සියලුම පුනරාවර්තන වියදම් සඳහා වූ ප්‍රතිපාදනවල එකතුවෙන් සියයට 6 කට සමාන ප්‍රතිපාදන ප්‍රමාණයක් අවම වශයෙන් කපා හැරීම සඳහා සියලුම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් හා ගණන්දීමේ නිලධාරීන් විසින් කටයුතු කළ යුතු බව දක්වා තිබුණ ද, ශ්‍රී ලංකා පොලීසියේ වැය විෂයන් 11 ක් සම්බන්ධයෙන් එලෙස කටයුතු කර නොතිබුණි. | 2023 වසර සඳහා ශ්‍රී ලංකා පොලිසිය වෙත වෙන් කරන ලද ප්‍රතිපාදන නීතිය හා සාමය කටයුතු පවත්වා ගෙන යෑම සඳහා ප්‍රමාණවත් නොවන බැවින් ඒ බව දන්වා ලේකම්, මහජන ආරක්ෂක අමාත්‍යාංශය මඟින් අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත දැනුම්දී ඇති බව දන්වා ඇත. | 2023 ජනවාරි 27 දිනැති අයවැය චක්‍රලේඛ අංක 01/2023 ප්‍රකාරව රජයේ වියදම් වඩාත් අරපිරිමැසුම්දායි ලෙස භාවිතා කිරීම හා අත්‍යාවශ්‍ය නොවන වියදම් හැකිතාක් අවම කිරමට කටයුතු කළ යුතු ය. |

## 2.2 තැන්පත් ශේෂයන්

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2013 වර්ෂයේදී සාර්ක් ත්‍රස්තවාදී හා මත්ද්‍රව්‍ය වැරදි නිරීක්ෂණ මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා ඉන්දියාවෙන් ලබාදී තිබුණු රු.45,837,000 ක පරිත්‍යාග මුදලින් ඉතිරිව පවතින රු. 11,503,192 ක මුදල අදාළ කාර්යය සඳහා උපයෝජනය නොකර තැන්පත් ගිණුමේ රඳවාගෙන පවතින අතර, ඒ සඳහා ඉදිරි වැඩපිළිවෙලක් ද නොවීය. | මෙම මුදල SAARC සමුළුවේදී තීරණයක් ලැබෙන තුරු රඳවා ගැනීමට සිදු වී ඇත. | අදාළ අරමුණ සඳහා ප්‍රතිපාදන උපයෝජනය කළ යුතු ය. |
| (ආ) | මුදල් රෙගුලාසි 571(2) ප්‍රකාරව ඉකුත් වූ තැන්පතු, මුදල් රෙගුලාසි 570 පරිදි රාජ්‍ය ආදායමට බැර කළ යුතු වුව ද, තැන්පතු ගිණුම් 05 ක රු.135,565,883 ක තැන්පතු එසේ ආදායමට බැර නොකර රඳවාගෙන තිබුණි. | මේ වන විට අදාළ තැන්පත්වලින් කොටසක් නිරවුල්කර ඇති අතර, ඉතිරි තැන්පතු රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කරමින් පවතින බවත් 2024.04.30 දිනට ශේෂය රු.79,470,169 ක් බවත් දන්වා ඇත. | ඉකුත් වූ තැන්පතු මුදල් රෙගුලාසි 570 පරිදි රාජ්‍ය ආදායමට බැර කළ යුතු ය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දඩ මුදල් අය කරගැනීම වේගවත් කිරීමත්, රාජ්‍ය ආදායමට එකතුවන දඩ මුදල් ප්‍රමාණය ඉහළ නැංවීමත්, මහජනයාට දඩ මුදල් ගෙවීම පහසු කිරීමත් අරමුණින් රථවාහන වැරදි සඳහා ස්වයංක්‍රීයව දඩ මුදල් ගෙවීමේ ක්‍රමවේදයක් (Spot Fine Information System) ස්ථාපිත කිරීම සඳහා 2014 වර්ෂයේ සිට සැලසුම් කරමින් පැවතිය ද මේ දක්වා අදාළ ක්‍රමය ස්ථාපිතව නොතිබුණි. | මෙම ව්‍යාපෘතිය කඩිනම් ව්‍යාපෘතියක් ලෙස මේ වන විට ක්‍රියාත්මක වී පවතින අතර ප්‍රවාහන අමාත්‍යාංශයේ නිර්දේශ යටතේ මේ වන විට මෙම කටයුතු සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුව සහ මූලික පිරිවිතර සකස් කිරීමේ කමිටුව වශයෙන් කමිටු 02 ක් නම් කර මෙහි වැඩකටයුතු සිදුකර ගෙන යන බව දන්වා ඇත. | මහජනයාට දඩ මුදල් ගෙවීම පහසු කිරීමේ අරමුණින් රථවාහන වැරදි සඳහා යෝජිත ස්වයංක්‍රීයව දඩ මුදල් ගෙවීමේ ක්‍රමවේදය කඩිනමින් ස්ථාපිත කිරීමට කටයුතු කළ යුතු ය. |

### 3.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබානොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | **බල අපරාධ වාර්තා වීම හා විසඳීම** | | |
| (i) | බරපතල තුවාල සිදු කිරීම හා මනුෂ්‍ය ඝාතනය යන බල අපරාධ ගත්විට 2018 -2022 කාලපරිච්ඡේදයේ පිළිවෙලින් 1431, 1373, 1356, 1375 හා 1482 වශයෙන් ද, සමාලෝචිත වර්ෂයේදී එහි ඉහළම අගය වූ 2,030 ක් වාර්තා වී තිබුණි. 2023 වර්ෂයේ මුල් මාස 10 තුළ වාර්තා වී තිබූ මනුෂ්‍ය ඝාතන 488 න් 52 ක් වෙඩි තැබීමෙන් සිදුව තිබූ මනුෂ්‍ය ඝාතන වේ. තංගල්ල, නුගේගොඩ, ගම්පහ, රත්නපුර හා ඇල්පිටිය යන | විගණනයෙන් දක්වා ඇති පරිදි බරපතල තුවාල සිදු කිරීම හා මනුෂ්‍ය ඝාතන යන බල අපරාධ වැඩි වශයෙන් වාර්තා වී ඇති කොට්ඨාසයන් බල අපරාධ වාර්තා වර්ධනය වීම සම්බන්ධයෙන් පළාත භාර ජ්‍යෙ.නි. පොලිස්පතිවරු හා කොට්ඨාශ භාර නිලධාරීන් දැනුවත්කර බල අපරාධ වාර්තා වීම වර්ධනය වීම සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙස දන්වා ඇති බව දැනුම්දී ඇත. | බරපතල තුවාල සිදු කිරීම හා මනුෂ්‍ය ඝාතනය යන බල අපරාධ වාර්තා වීම වර්ධනය වීම අවම කිරීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගත යුතු ය. |

| | | | |
|---|---|---|---|
| | පොලිස් කොට්ඨාශ 05 තුළ පිළිවෙලින් 32, 27, 24, 24 හා 20 වශයෙන් මනුෂ්‍ය ඝාතන ඉහළ සංඛ්‍යාවක් වාර්තා වී තිබිණි. "මහජන ආරක්ෂාව හා සාමය පවත්වාගෙන යාම" හා "අපරාධ පාලනය හා වැළැක්වීම" ශ්‍රී ලංකා පොලීසියේ ප්‍රධාන කාර්යයන් 08 න් 02 ක් වන බැවින් රට තුළ සිදුවන මෙම බල අපරාධ වාර්තා වීම වර්ධනය වීම සම්බන්ධයෙන් ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගතයුතුව පැවතුණි. | | |
| (ii) | ගෙවල් බිඳීම හා කොල්ල කෑම යන බල අපරාධ ගත්විට පසුගිය වසර 06 ක කාලපරිච්ඡේදය තුළ වැඩිම සංඛ්‍යාවක් වාර්තා වී තිබුණේ 2023 වර්ෂයේදී විය. ගෙවල් බිඳීමේ බල අපරාධය සම්බන්ධයෙන් ගත් විට 2018 වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂයේ වාර්තා වීම සියයට 50 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. ගෙවල් බිඳීම හා කොල්ල කෑම යන බල අපරාධ විසඳීම ගත්විට පසුගිය වසර 06 තුළ අඩුම විසඳීමේ ප්‍රතිශතයක් වාර්තා වී තිබුණේ 2023 වර්ෂයේදී විය. ගෙවල් බිඳීම් විසඳීමේ ප්‍රතිශතය 2018 දී සියයට 60 ක්ව පැවතිය ද, 2023 දී සියයට 50 දක්වා පහත වැටී තිබුණි. කොල්ල කෑම් විසඳීම 2018 දී සියයට 75 ක්ව පැවතිය ද 2023 දී සියයට 61 දක්වා අඩු වී තිබුණි. | ගෙවල් බිඳුම් හා කොල්ලකෑම් අපරාධ ගත්විට එම අපරාධ විසඳීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇතත්, එම අපරාධයන් සම්බන්ධයෙන් සාක්ෂි හෙළිකර ගැනීම සඳහා ගත වන කාලය අනුව විසඳීමේ ප්‍රතිශතයන් අඩුවෙන් පෙන්නුම්කර ඇති බව දක්වා ඇත. | ගෙවල් බිඳීම හා කොල්ලකෑම යන බල අපරාධ විසඳීම කඩිනම් කිරීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගත යුතු ය. |
| (ආ) | **කාන්තාවන්ට එරෙහි බල අපරාධ වාර්තා වීම පිළිබඳව** | | |
| | 2020-2023 කාලපරිච්ඡේදයේ කාන්තාවන්ට එරෙහි බල අපරාධ වාර්තාවීම් පිළිවෙලින් 595, 568, 600 හා 759 වශයෙන් විය. 2022 වර්ෂයට සාපේක්ෂව කාන්තාවන්ට එරෙහි බල අපරාධ වාර්තාවීම 2023 | එක් වර්ෂයක අවසාන කාලය තුළදී වාර්තා වන අපරාධ එම වර්ෂය තුළදීම විසඳීමට නොහැකි වුව ද, ඉතා කෙටි කාලයකින් එම අපරාධ විසඳීමට පියවර ගෙන ඇත. | අපරාධ පාලනය හා වැළැක්වීම පිළිබඳව ප්‍රමාණවත් ක්‍රියාමාර්ගගත යුතු ය. |

| | | |
|---|---|---|
| වර්ෂයේදී සියයට 27 කින් වැඩි වී තිබූ අතර, ඒ අතර දූෂණ සංඛ්‍යාව 182 සිට 226 දක්වා ද, බරපතල තුවාල සිදු කිරීම් සංඛ්‍යාව 154 සිට 221 දක්වා ද, පිහි ආදියෙන් තුවාල සිදු කිරීම් සංඛ්‍යාව 74 සිට 96 දක්වා ද, බරපතල ලිංගික අපයෝජන සංඛ්‍යාව 21 සිට 37 දක්වා ද වැඩි වී තිබීම කැපී පෙනුනි. 2023 වර්ෂයේදී මෙම අපරාධ විසඳීම සියයට 99 ක ප්‍රගතියක් පෙන්නුම් කළ ද අපරාධ වාර්තා වීම වැඩි වී ඇති බැවින් ශ්‍රී ලංකා පොලීසියේ ප්‍රධාන කාර්යයන් අතරින් එකක් වන "අපරාධ පාලනය හා වැළැක්වීම" පිළිබඳව ප්‍රමාණවත් ක්‍රියාමාර්ගගත යුතුව පැවතුණි. | | |

**3.3 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2016 වර්ෂයේදී පමණ ආරම්භකර තිබූ කණිෂ්ඨ ශ්‍රේණියේ නිලධාරීන්ගේ විවාහක නිල නිවාස ඉදිකිරීම, රථ වාහන මූලස්ථානය ඉදිකිරීම, වැලිගම පොලිස් ස්ථානය ඉදිකිරීම සහ කොල්ලුපිටිය, කුරුඳුවත්ත, තිරුක්කෝවිල්, මල්ලාවි හා නාරාහේන්පිට පොලිස් ස්ථානවල වැඩ අවසන් කිරීම යන ප්‍රමාද වූ ව්‍යාපෘති 08 සඳහා මුළු ඇස්තමේන්තු වියදම රු. මිලියන 1,903.35 ක් ද, 2022.12.31 දිනට මුළු වියදම රු. මිලියන 985.57 ක් ද විය. 2023 වර්ෂයේ රු. මිලියන 299 ක් ප්‍රතිපාදන සලසාදී තිබුණ ද, වියදම රු. මිලියන 133.81 ක් පමණක් විය. ඉදිකිරීම් ප්‍රමාද වූ මෙම ව්‍යාපෘති 08 හි වර්තමාන ප්‍රගතිය ද මන්දගාමීව පැවතීම නිසා ව්‍යාපෘති ආරම්භක අරමුණු ඉටුවීම තවදුරටත් ප්‍රමාද වෙමින් පැවතුණි. | ඉහත ව්‍යාපෘති 08හි ප්‍රගතිය සියයට 55,79, 50, 80, 72, 60, 80 සහ 70 ක් බව දන්වා ඇත. | ව්‍යාපෘති අරමුණු ඉටුකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු ය. |

### 3.4 වාර්ෂික කාර්යසාධන වාර්තාව

2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල කළ යුතුව තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කළ යුතු වුවත්, එසේ සිදුකර නොතිබුණි. | යොමුගත චක්‍රලේඛයේ 12.1 ඡේදය අනුව වාර්ෂික කාර්යසාධන වාර්තාව මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ගත වීමට පෙර සභාගත කිරීම සඳහා නියමිත විධිවිධාන යටතේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු බව දක්වා ඇත. ඒ අනුව මූල්‍ය ප්‍රකාශන තුළ කාර්යසාධන වාර්තාව ඇතුළත්ව නොමැත. | රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |

### 3.5 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2011 වර්ෂයේදී පොලිස් සැරයන් හා පොලිස් කොස්තාපල් නිලධාරීන් සඳහා හිස්වැසුම් 75,000 ක් රු.93,455,119 කට සැපයීම සඳහා වූ ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී සිය සැපයුම අවලංගු කිරීමට එරෙහිව සැපයුම්කරු බේරුම්කරණය වෙත ගොස් තිබුණි. බේරුම්කරණයේදී 2017 ජනවාරි 21 දින ලබාදී තිබූ තීන්දුව වූ හිස්වැසුම් 75,000 සඳහා වූ මුදල සහ ඒ සඳහා වන අනෙකුත් ගාස්තු ගෙවීම ද ශ්‍රී ලංකා පොලීසිය විසින් | වාණිජ මහාධිකරණ තීන්දුව ප්‍රකාරව ශ්‍රී ලංකා පොලීසිය විසින් හිස් වැසුම් 60,000 ක් සඳහා සැපයුම්කාර ආයතනය වෙත ගෙවිය යුතු ඇමරිකානු ඩොලර් 414,000 ක මුදලින් සියයට 10 ක මුදල වන ඇමරිකානු ඩොලර් 41,400 ක මුදලක් 2022 මාර්තු 16 දින විදේශීය නියෝජිත ආයතනය වෙත ගෙවා ඇති අතර, ඉතිරි මුදල ගෙවීම සඳහා ණයවර ලිපි විවෘත කර ඇති බවත්, 2023 ජූනි 06 දින ශ්‍රී ලංකාව වෙත භාණ්ඩ ලැබීමට නියමිත බවත් දන්වා තිබුණි. | මෙම ප්‍රසම්පාදන හා බේරුම්කරණ ක්‍රියාවලියේ අඩුපාඩු මත රජයට දැරීමට සිදුවන අමතර වියදම් සම්බන්ධයෙන් වගකිවයුත්තන් හඳුනා ගැනීමට කටයුතු කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| | ප්‍රතික්ෂේප කරමින් අඛණ්ඩව අධිකරණ ක්‍රියාමාර්ගයක යෙදී තිබුණු අතර, සැපයුම්කරුගේ ගබඩා ගාස්තු, නීති ගාස්තු හා විනිමය අනුපාත වැඩිවීමේ අවාසිය ද ශ්‍රී ලංකා පොලිසිය දැරිය යුතු බවට සැපයුම්කරු ඉල්ලා තිබුණි. 2023 ජනවාරි 25 දින වන විට රු.219,357,715 ක් ගෙවීමට සිදුවෙතැයි ශ්‍රී ලංකා පෙලිසිය විසින් ඇස්තමේන්තුකර තිබුණ ද, ප්‍රසම්පාදන ක්‍රියාවලියේ අවිධිමත්භාවය හා දීර්ඝ කාලයක් ගත වුව ද, සමථකරණයකට නොපැමිණ සිදු වූ ප්‍රමාදයන් හේතුවෙන් දැරීමට වන පිරිවැය සඳහා වගකිවයුත්තන් හෝ හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි. | | |
| (ආ) | හබරාදූව “නිල සෙවන” යෝජනා ක්‍රමයෙන් නිවසක් රු. මිලියන 3.8 බැගින් රු. මිලියන 729.6 කට නිවාස 192 ක් මිලදී ගැනීමට 2017 දෙසැම්බර් 29 දින ගිවිසුමකට එළඹ තිබුණි. 2019 අප්‍රේල් 02 දින වන විට රු. මිලියන 500 ක අත්තිකාරම් ගෙවා තිබුණු අතර, මෙම නිල නිවාස අවශ්‍යතාවය, ඉල්ලුම සහ නිවාසයන්හි ඉදිකිරීම්වල තත්ත්වය පිළිබඳ නිවැරදි අධ්‍යනයක් සිදු නොකර මිලදී ගැනීමට ගිවිසුම්ගතව තිබූ අතර 2024 අප්‍රේල් මාසය වන විටත් මෙම නිවාස පවරා ගැනීම අවසන්ව නොතිබුණි. | අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක /24/0834/640/012 මගින් ඉදිරිපත් කර තිබූ අමාත්‍ය මණ්ඩල සංදේශයේ කරුණු සඳහා 2024.05.06 දින අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබාදී ඇත. ඒ අනුව ඉදිරි කටයුතු සිදු කරනු ලැබන බව දන්වා ඇත. | ගිවිසුම් ප්‍රකාරව නිවාස පවරා ගැනීම සිදුකළ යුතු ය. |

## 3.6 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | | පහත සඳහන් ඉඩම් හා ගොඩනැගිලි ශ්‍රී ලංකා පොලීසියට පවරා ගැනීමේ කටයුතු 2017 වර්ෂයේ සිට ආරම්භකර තිබුණ ද, 2023 දෙසැම්බර් මාසය වන විටත් අවසන්ව නොතිබුණි. | | |
| | (i) | පොලිස් අධ්‍යයන ආයතනයක් පිහිටුවීමට යෝජිත අක්කර 12 රූඩ් 01 පර්චස් 08 ක ප්‍රමාණයකින් යුත් මල්වානේ පිහිටි ඉඩම | මෙම ඉඩම අත්කර ගැනීම සම්බන්ධයෙන් ගරු නීතිපතිතුමාගේ උපදෙස් සඳහා යොමුකර ඇති බව දන්වා ඇත. | ඉඩම පවරා ගැනීම කඩිනමින් අවසන් කළ යුතු ය. |
| | (ii) | පොලිස් අශ්වාරෝහක කොට්ඨාශය හා පොලිස් රණවිරු සුරැකුම් මධ්‍යස්ථානය ස්ථාපිත කිරීමට යෝජිත අක්කර 75 ක් වූ හොරණ ඇල්ලකන්ද වත්ත ඉඩම | මෙම ඉඩම අත්කර ගැනීම සම්බන්ධයෙන් සඳහා මූලික පිඹුරක් ලබාගැනීමට මිනින්දෝරු අධිකාරිය වෙත දන්වා ඇති බව දක්වයි. | ඉඩම පවරා ගැනීම කඩිනමින් අවසන් කළ යුතු ය. |
| (ආ) | | ඉංගිරියේ උසස් පුහුණු පොලිස් විද්‍යාලය සහ ඉංගිරිය පොලිස් ස්ථානය ඉදිකිරීම සඳහා 2008 වර්ෂයේ වැඩ ආරම්භකර රු. මිලියන 8.8 ක් වැයකර ඉදිකිරීම් අතරමඟ නවතා තිබුණි. | අක්කර 04 රූඩ් 02 පර්චස් 07.2 ක් වූ මෙම ඉඩම ශ්‍රී ලංකා පොලිසිය වෙත ඉංගිරිය ප්‍රාදේශීය ලේකම් විසින් 2024.02.21 දින පවරාදී ඇති බව දන්වා ඇත. | ඉදිකිරීම් අවසන් කිරීමට කටයුතු කළ යුතු ය. |
| (ඇ) | | 2016 දෙසැම්බර් මස එකක් රු. මිලියන 3.3 බැගින් රු. මිලියන 333 කට ගාල්ල, වැකුණගොඩ "නිල සෙවන" නිවාස ව්‍යාපෘතියෙන් මිලදී ගත් නිවාස 100 ට අදාළ පැවරුම් ඔප්පු 2024 මාර්තු මාසය වන විටත් ලබාගෙන නොතිබුණි. | පැවරුම් ඔප්පු සකස් කිරීම සඳහා සංශෝධනය කරන ලද ගිවිසුම් පත්‍රයක් සකස් කොට ඉදිරිපත් කරන ලෙස 2024.03.25 දින අදාළ ආයතනය දැනුවත්කර ඇත. | මිලදී ගැනීමට අදාළ පැවරුම් ඔප්පු කඩිනමින් ලබාගැනීමට කටයුතු කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ජාතික පොලිස් අභ්‍යාස ආයතනයේ අත්තිඩියේ පිහිටි පෙරසව් ගොඩනැගිලි 05 ක් සමඟ අක්කර 6 ක පමණ භූමි ප්‍රමාණයක් ශ්‍රී ලංකා යුධ හමුදාවේ හට පිරිස්වලට නවාතැන් ගැනීම සඳහා තාවකාලිකව පවරාදී වසර 05 ක් පමණ ගතවී ඇතත්, එම පරිශ්‍රයේ ජල හා විදුලි බිල්පත් ද ශ්‍රී ලංකා පොලීසියට වැය බරක් වී තිබුණි. එසේම එම භූමිය ශ්‍රී ලංකා පොලීසියේ ප්‍රයෝජනය සඳහා පවරා ගැනීමට නොහැකි වී තිබුණි. | ජාතික පොලිස් අභ්‍යාස ආයතනයේ ඉදිරි පුහුණු කටයුතු සඳහා මෙම භූමිය යොදා ගැනීමට නියමිත බැවින්, කඩිනමින් නැවත පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් සිටින බව දන්වා ඇත. | භූමිය ශ්‍රී ලංකා පොලීසියේ ප්‍රයෝජනය සඳහා කඩිනමින් පවරා ගත යුතු ය. |
| (ඉ) | කටාන ජාතික පොලිස් විද්‍යාලයේ නේවාසික පහසුකම් ලබාදීම සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීමට 2019 අගෝස්තු 20 දින ලංසු ප්‍රදානයකර තිබූ අතර, ව්‍යාපෘතියේ කටයුතු මන්දගාමීව සිදුවීම නිසා 2023 අප්‍රේල් 26 දින ඉදිකිරීම් අත්හිටුවා තිබූ අතර, ඉටුකර ඇති වැඩවල වටිනාකම රු. 97,290,003 ක් පමණක් බවට උපදේශක ආයතනය තීරණයකර තිබුණි. ඒ අනුව රු.42,252,164 ක් නැවත අයවීමට තිබුණ ද, එය අයකර නොතිබුණි. ගොඩනැගිල්ලේ අත්තිවාරමේ හා කොන්ක්‍රීට් තට්ටුවල (Slab) පිටතට නෙරා ඇති යකඩ කම්බි මල බැදී දිරාපත් වෙමින් පැවති අතර, වැඩබිමේ තිබූ රු.1,744,875 ක් පමණ වටිනා කම්බි තොගයක්ද මල බැදී දිරාපත් වෙමින් පැවතුණි. | කොන්ත්‍රාත්තුව අවලංගු කිරීම අධිකරණය ඉදිරියේ අභියෝගයට ලක් වී ඇති බැවින් වැඩ බිමේ ඇති ඉදිකිරීම් ද්‍රව්‍ය පිළිබඳව කටයුතු කළ නොහැකි තත්ත්වයක් ඇත. | ව්‍යාපෘති ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |
| (ඊ) | කටාන ජාතික පොලිස් විද්‍යාලයේ යෝජිත අධ්‍යාපන හා පරිපාලන ගොඩනැගිල්ල ඉදිකිරීමේ සංශෝධිත මුළු පිරිවැය රු.224,616,490 ක් වූ අතර, 2018 අගෝස්තු 07 දින | සැලසුම් දෝෂයක් බැවින් මේ සඳහා දැරීමට සිදු වන අමතර වියදම් මෙහි සැලසුම් කටයුතු සිදු කරන ලද උපදේශක ආයතනයෙන් අය කරගැනීමට උපදේශන | ව්‍යාපෘතිය නියමිත ලෙස සැලසුම්කිරීම මෙන්ම ගිවිසුම් ප්‍රකාරව කටයුතු කිරීම කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| | ලංසු ප්‍රදානයකර තිබුණි. සැලසුම් දෝෂයක් හේතුවෙන් පඩිපෙළ සම්පූර්ණයෙන් කඩා ඉවත්කිරීමට සිදුව තිබූ අතර, ඒ සඳහා රු.687,181 ක් වැය වෙතැයි ඇස්තමේන්තුකර තිබුණි. මෙම තත්ත්වය මත ව්‍යාපෘතියට සිදුවන අමතර වියදම් හා ප්‍රමාදය පිළිබඳ වගකීම භාරගන්නා පාර්ශවය පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවුණි. | ආයතනය එකඟ වූ අතර, එම ආයතනයෙන් අයකර ගැනීමට කටයුතු සිදුකර ඇති බව දන්වා ඇත. | |
| (උ) | පොලිස් අභ්‍යාස අයතනයේ නව පරිපාලන ගොඩනැගිල්ලෙහි ශ්‍රවනාගාරය සඳහා රු.6,547,992 ක් වැයකර 2021 දෙසැම්බර් 23 දින භාෂා පරිවර්තන පද්ධතියක් මිලට ගෙන ඇති නමුත්, 2023 දෙසැම්බර් මාසය වන විටත් මෙම භාෂා පරිවර්තන පද්ධතිය නිශ්කාර්යව පැවතුණි. | මෙම අයිතමයන් නව පරිපාලන ගොඩනැගිල්ලෙහි ශ්‍රවණාගාරයේ ඉදිකිරීම් කටයුතු අවසන් කිරීමෙන් අනතුරුව සවි කරන තෙක් එම අයිතමයන් සුරක්ෂිතභාවය සඳහා ගබඩාවේ තැන්පත්කර ඇති බව දන්වා ඇත. | වත්කම් මිලදීගත් අරමුණ වෙනුවෙන් යෙදවිය යුතු අතර, එම වත්කම් නිෂ්කාර්ය නොවීමට වගබලාගත යුතු ය. |

## 3.7 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ද්විත්ව මනුෂ්‍ය ඝාතනයට අදාළව සිදුකරන ලද පරීක්ෂණය අනුව 2019 වර්ෂයේදී පොලිස් නිලධාරීන් 15 දෙනෙකු අත්අඩංගුවට ගෙන රක්ෂිත බන්ධනාගාරගත කර තිබුණි. පසුව ඔවුන්ගේ කළත්‍රයන් විසින් ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත කළ ඉල්ලීම් මත 2022 පෙබරවාරි 25 දිනැති නියෝගය අනුව පොලිස් නිලධාරීන් තිදෙනෙකුගේ කළත්‍රයන් වෙත එකතුව රු.4,741,056 ක් අඩවැටුප් ලෙස 2023 නොවැම්බර් වන විට ගෙවා තිබුණි. මෙම ද්විත්ව ඝාතනයට අදාළ පරීක්ෂණ, අධිකරණ ක්‍රියාමාර්ගවල වර්තමාන ප්‍රගතිය හා සෙසු නිලධාරීන්ට ගෙවීම් කළ අඩවැටුප් පිළිබඳව මෙන්ම | ද්විත්ව මනුෂ්‍ය ඝාතනයට අදාළව සිදු කරන පරීක්ෂණයේදී හෙළි වූ කරුණු මත අත්අඩංගුවට ගත් පොලිස් නිලධාරීන්ට ගෙවනු ලබන අඩ වැටුප් පිළිබඳ තොරතුරු හා ද්විත්ව ඝාතනයට අදාළ පරීක්ෂණ සහ අධිකරණ ක්‍රියාමාර්ගවල වර්තමාන ප්‍රගතිය පරීක්ෂාකර දැනුම් දීමට කටයුතු කරන බව දන්වා ඇත. | අධිකරණ තීන්දු ලබාදෙන තුරු ගෙවීම් කටයුතු සිදු නොකළ යුතු ය. |

පරීක්ෂණවල ප්‍රගතිය පිළිබඳ තොරතුරු ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත වාර්තා කිරීම් පිළිබඳ තොරතුරු විගණනයට අනාවරණය නොවීය. මෙලෙස සැකකරුවන් ලෙස විමර්ශන මගින් හඳුනාගත් නිලධාරීන්ගේ කළත්‍රයන් වෙත දීර්ඝකාලීනව අඩවැටුප් ගෙවීම වැරදි පූර්වාදර්ශයක් විය හැකි බව විගණනයේදී බැහැර කළ නොහැකි විය.

## 3.8 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රථවාහන වේග සීමා පරීක්ෂා කිරීමේ උපකරණ 25 ක් අවසන් වරට 2016 වර්ෂයේදී මිලදීගෙන තිබුණු අතර, පැවති උපකරණ විශාල ප්‍රමාණයක් අක්‍රීය තත්ත්වයේ පැවතුණි. වර්ෂ 2018 සිට 2023 දක්වා වාර්ෂිකව වේග මාපක යන්ත්‍ර 500 බැගින් ඉල්ලුම්කර තිබුණ ද, එයින් කොටසක් හෝ මිලදී ගෙන නොතිබුණි. ඒ අනුව වේග සීමා කඩකරමින් අධික වේගයෙන් රථවාහන ධාවනය කිරීම, රථවාහන අනතුරු සිදුවීමට ප්‍රධාන හේතුවක් වන නමුත් එය අවම කිරීමට අවශ්‍ය උපකරණ මිලදී ගැනීමට ශ්‍රී ලංකා පොලීසිය ක්‍රියාකර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් ප්‍රමුඛතාවය ලබාදී කටයුතු කරන බව දන්වා ඇත. | අදාළ අරමුණු ඉටුකර ගැනීමට අවශ්‍ය පහසුකම් ලබාදීමට කටයුතු කළ යුතු ය. |
| (ආ) | ශ්‍රී ලංකා පොලීසිය මගින් අධිකරණ වෙත යොමු කෙරෙන අපරාධ හෝ වැරදිවලට අදාළව තවදුරටත් පවත්වාගෙන යන අධිකරණ කටයුතු සම්බන්ධ තොරතුරු, තීන්දු ලබාදුන් නඩු පිළිබඳ විස්තර, බහා තැබීම් හෝ නිශ්ප්‍රභාවීම් වූ නඩු හා සැකකරුවන් වරදකරුවන් වූ හෝ සැකකරුවන් නිදහස් වූ | අපරාධ විමර්ශන හා පරිපාලනය සඳහා ප්‍රධාන වශයෙන් පරිගණක වැඩසටහන් 20 ක් පවතින අතර ඒකාබද්ධ පරිගණක තොරතුරු පද්ධතියක් සකස් කිරීමෙන් පසුව ශ්‍රී ලංකා පොලීසිය මගින් අධිකරණ වෙත යොමු කෙරෙන අපරාධ හෝ වැරදිවලට අදාළව | අධිකරණ කටයුතු සම්බන්ධ තොරතුරු ඇතුළත් යාවත්කාලීන තොරතුරු පද්ධතියක් පවත්වාගත යුතු ය. |

| | | | |
|---|---|---|---|
| | යනාදී වශයෙන් විස්තර ඇතුළත් යාවත්කාලීන තොරතුරු පද්ධතියක අවශ්‍යතාවය කාර්යසාධනය සමාලෝචනයේදී වැදගත් වන නමුත් එවැනි පද්ධතියක් පවතින බව සනාථ නොවී ය. | තවදුරටත් පවත්වා ගෙන යන අධිකරණ කටයුතු සම්බන්ධ තොරතුරු, තීන්දු ලබාදුන් නඩු පිළිබඳ විස්තර, බහා තැබීම් හෝ නිශ්ප්‍රභ වීම් වූ නඩු වැනි විස්තර ඇතුළත් කර යාවත්කාලීන තොරතුරු පද්ධතියක් පවත්වා ගැනීමට හැකි වනු ඇති බව දන්වා ඇත. | |
| (ඇ) | ගම්පහ පොලිස් කොට්ඨාශයට අයත් නිලධාරියෙක් චෝදනාවට ලක්වීම මත 2018 අප්‍රේල් 18 දින සිට වැඩ තහනමට ලක්ව තිබූ අතර, එම නිලධාරියාට 2018 සැප්තැම්බර් මස සිට 2022 ජනවාරි දක්වා රු.3,251,000 ක් අඩ වැටුප් ලෙස ගෙවා තිබුණි. 2022 ඔක්තෝබර් මස මෙම නිලධාරියා අදාළ චෝදනාවට අධිකරණයෙන් වරදකරු වීම මත ගෙවන ලද අඩවැටුප් වටිනාකම අයකර ගැනීමට නොහැකිව තිබූ අතර, අඩ වැටුප් ගෙවීමට ගනු ලැබූ තීරණයේ නිවැරදිතාවය පිළිබඳව ද ගැටළු පැවතුණි. | මුදල ආපසු ගෙවන ලෙස අධ්‍යක්ෂ නීති කොට්ඨාශයේ අංක L3/B/04/2022/OW/11/94/2023 හා 2023.10.04 දිනැති ලිපිය මගින් අදාළ නිලධාරියා දැනුවත් කර ඇති අතර, එසේ නොගෙවන්නේ නම් නඩු පැවරීමට කටයුතු කරන බව දැනුම්දී ඇත. | අධිකරණ තීන්දු ලබා දෙන තුරු ගෙවීම් සිදු නොකළ යුතු ය. |
| (ඈ) | ප්‍රභූ ආරක්ෂාව සැලසීමට අදාළ පොලිස්පතිගේ 2020 සැප්තැම්බර් 30 දිනැති අංක 2687/2020 දරන චක්‍රලේඛයට පරිබාහිරව මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ පැවැත්වෙන ප්‍රභූ ආරක්ෂාව සඳහා නිලධාරීන් අනුයුක්ත කිරීමේ කමිටුව මගින් වර්තමානය වන විට අදාළ නිලයේ නොමැති හා වෙනත් ප්‍රභූන් වෙතද ප්‍රභූ ආරක්ෂාව සැලසිය හැකි ප්‍රභූන් වෙත අනුමත සීමාව ඉක්මවා ප්‍රභූ ආරක්ෂකයින් වසර ගණනාවක් අඛණ්ඩව අනුයුක්තකර සිටින අවස්ථා පැවති අතර, ඒ සඳහා පවතින නෛතික ප්‍රතිපාදන කවරේ ද යන්න විගණනයට අනාවරණය නොවුණි. ප්‍රභූ | ප්‍රභූ ආරක්ෂකයින් යෙදවීම, මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ පැවැත්වෙන ප්‍රභූ ආරක්ෂාව සඳහා නිලධාරීන් අනුයුක්ත කිරීමේ කමිටුව මගින් අනුමත කර ඇති අතර, එම ප්‍රභූවරුන්ගේ ආරක්ෂාව ඉවත් කිරීම සම්බන්ධව අවස්ථානුකූලව විමසීම් කර ඇතත්, ප්‍රභූ ආරක්ෂාව සඳහා නිලධාරීන් අනුයුක්ත කිරීමේ කමිටුව මගින් ඒ සඳහා නිසි අනුමැතියක් ලැබී නොතිබීම මත විවිධ තැනැත්තන් සඳහා ප්‍රභූ ආරක්ෂකයන් වසර ගණනාවක් අඛණ්ඩව අනුයුක්තකර තිබීම සිදුව ඇති බව දන්වා ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු සිදුකර වියදම් පිරිමැසුම්දායකවන අයුරින් කටයුතු කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| | ආරක්ෂක කොට්ඨාශය යටතේ ඇති පොලිස් කොට්ඨාශ 09 ක් සඳහා 2022 ජනවාරි 01 දිනට 3884 ක් වූ නිලධාරීන් 2023 සැප්තැම්බර් 30 දින වන විට 4,859 ක් දක්වා වැඩිකර තිබුණි. 2018 – 2022 කාලපරිච්ඡේදයේ ප්‍රභූ ආරක්ෂක කොට්ඨාශයේ වාර්ෂික සාමාන්‍ය වියදම රු.මිලියන 4,342 ක් වුව ද, 2023 වර්ෂයේදී එම වියදම රු. මිලියන 5,833 දක්වා වැඩි වී තිබුණි. මේ අනුව ඉහත චක්‍රලේඛයට පරිබාහිරව අනුයුක්තකර සිටින නිලධාරීන් වෙනුවෙන් ගෙවා ඇති වැටුප් හා දීමනා වියදම (විශේෂ දීමනාව ඇතුළු) පිරිමැසුම්දායක නොවන වියදම් බව නිරීක්ෂණ විය. | | |
| (ඉ) | සමාලෝචිත වර්ෂය අවසාන වන විට නිලධාරීන් 2,458 ක ගෙන් අයවිය යුතු ශේෂවල එකතුව රු.60,874,303 ක් වූ අතර, එම ණයශේෂ තුළ වර්ෂ 05 ට වැඩි නිලධාරීන් 1,590 කගේ හිඟහිටි ණයශේෂවල එකතුව රු.41,743,898 ක් විය. | වර්ෂ 5ට වැඩි හිඟහිටි ණය ශේෂයෙන් රු.623,733 ක් 2024 පළමු කාර්තුව තුළ අය කිරීමට කටයුතු කර ඇති බව දන්වා ඇත. | හිඟහිටි ණයශේෂයන් අයකර ගැනීමට කටයුතු කළ යුතු ය. |
| (ඊ) | 2022 වර්ෂයේදී ප්‍රජා පොලිස් පැවැත්විය යුතු උපදේශක සභා රැස්වීම් 7,224 කින් රැස්වීම් 4,620 ක් ද, 2023 වර්ෂයේදී පැවැත්විය යුතු රැස්වීම් සංඛ්‍යාව 6,020 කින් රැස්වීම් 3,848 ක් පමණක් පවත්වා තිබූ අතර පොලිස් ස්ථාන මට්ටමින් ප්‍රජා පොලිස් උපදේශක සභාව 2022 වර්ෂයේදී 12 වතාවක් වූ රැස්වීම් වාර ගණන 2023 වර්ෂයේදී 10 ක් දක්වා අඩු කළ ද, රැස්වීමේ ප්‍රගතිය වර්ෂ දෙකෙහිම සියයට 64 මට්ටමේ විය. | පොලිස්පති චක්‍රලේඛ 2758/2023 නමින් නව චක්‍රලේඛයක් නිකුත් කිරීමත්, ප්‍රජා පොලිස් ඒකක සඳහා පත්කර ඇති නිලධාරීන් ඒ සඳහා පූර්ණ කාලීනව යෙදවීමට අවශ්‍ය කටයුතු කිරීමත් මඟින් ප්‍රජා පොලිස් කමිටු ශක්තිමත් කිරීමට කටයුතුකර ඇති බව දන්වා ඇත. | වර්ෂයේදී සැලසුම් කළ පරිදි ප්‍රජා පොලිස් උපදේශක සභා රැස්වීම් පැවැත්වීමට කටයුතු කළ යුතු ය. |
| (උ) | ප්‍රජා පොලිස් ස්ථානීය මහජන ආරක්ෂක කමිටු 2022 හා 2023 වර්ෂවලදී පිළිවෙලින් 7,224 ක් හා 6,020 ක් පැවැත්විය යුතු | පොලිස්පති චක්‍රලේඛ 2758/2023 නමින් නව චක්‍රලේඛයක් නිකුත් කිරීමත්, ප්‍රජා පොලිස් ඒකක සඳහා | වර්ෂයේදී සැලසුම් කළ පරිදි ප්‍රජා පොලිස් උපදේශක සභා රැස්වීම් පැවැත්වීමට කටයුතු කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| | වුවත්, 4,523 ක් හා 3,847 ක් පමණක් පවත්වා තිබුණි. පොලිස් ස්ථාන මට්ටමින් ප්‍රජා පොලිස් ස්ථානීය මහජන ආරක්ෂක කමිටු පැවැත්වීම 2022 වර්ෂයේදී 12 වතාවක් සිදුවිය යුතු වුව ද, කමිටු පැවැත්වීමේ ප්‍රගතිය සියයට 63 මට්ටමේ විය. 2023 වර්ෂයේදී කමිටු පැවැත්වීම අවස්ථා 10 දක්වා අඩුකර තිබුණු අතර, ඒ අනුව කමිටු පැවැත්වීමේ ප්‍රගතිය සියයට 69 ක් දක්වා සුළු වශයෙන් පමණක් වර්ධනය වී තිබුණි. | පත්කර ඇති නිලධාරීන් ඒ සඳහා පූර්ණ කාලීනව යෙදවීමට අවශ්‍ය කටයුතු කිරීමත් මගින් ප්‍රජා පොලිස් කමිටු ශක්තිමත් කිරීමට කටයුතුකර ඇති බව දන්වා ඇත. | |
| (ඌ) | 1865 අංක 16 දරන පොලිස් ආඥා පනත සංශෝධනය කිරීමේ අවශ්‍යතාවය අනුව සංශෝධන සිදුකළ යුතු ක්ෂේත්‍ර 16 ක් ද 2014 වර්ෂයේදී හඳුනාගෙන තිබුණි. වර්තමාන හා අනාගත සමාජීය හා තාක්ෂණික සංවර්ධන අවශ්‍යතාවයන්ට ගැළපෙන අයුරින් යාවත්කාලීනකර සංශෝධනය කිරීම සඳහා 2014 නොවැම්බර් 19 වන දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ද ලැබී තිබුණ ද, 2024 අප්‍රේල් මාසය වන විටත් පනත සංශෝධනය වී නොතිබුණි. | නීති කෙටුම්පත් සම්පාදක විසින් පොලිසියේ නිරීක්ෂණ ලබාගැනීමෙන් පසු අවසන් කෙටුම්පත සකස්කර අවසන්ව ඇත. | අමාත්‍ය මණ්ඩල අනුමැතිය පරිදි 1865 අංක 16 දරන පොලිස් ආඥා පනත සංශෝධනය සිදුකළ යුතු ය. |
| (එ) | 2019 අංක 10 දරන මෝටර් වාහන (සංශෝධන) පනත මගින් හඳුන්වා දුන් මෝටර් රථවාහන වැරදි සිදුවන වාර ගණන අනුව දඩ මුදල් අය කිරීමේ ක්‍රමය 2019 ජූනි 20 දින සිට ක්‍රියාත්මක වන නමුත් රථවාහන වැරදි සම්බන්ධයෙන් වරදකරුවන් එකම වරද සිදු කරන වාර ගණන පැහැදිලිව හඳුනාගත හැකි පරිදි තොරතුරු පද්ධතියක් ශ්‍රී ලංකා පොලීසිය ක්‍රියාත්මක නොකිරීම නිසා එකම වරද කිහිප අවස්ථාවක් සිදු | ස්වයංක්‍රීය දඩ මුදල් ගෙවීම සහ අවාසි සහගත ලකුණු ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීමෙන් පසු මෝටර් රථ වැරදි සිදුවන වාර ගණන අනුව දඩ මුදල් අය කිරීම සිදුකළ හැකි වනු ඇත. | 2019 අංක 10 දරන මෝටර් වාහන (සංශෝධන) පනත මගින් හඳුන්වා දුන් මෝටර් රථවාහන වැරදි සිදුවන වාර ගණන අනුව දඩ මුදල් අය කිරීමේ ක්‍රමය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු කඩිනමින් සිදුකළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| | කරන වරදකරුවන්ගෙන් නිවැරදි දඩ මුදල අය කරගැනීමට නොහැකි වී තිබුණි. | | |
| (ඒ) | පැලියගොඩ ලිපිද්‍රව්‍ය ගබඩාවේ 2023 ජූනි 22 දින සිදුකර තිබූ භෞතික තොග ගණනයේදී භාණ්ඩ අයිතම 72 කට අයත් ඒකක 60082 ක ඌණතාවයක් ද, භාණ්ඩ අයිතම 45 කට අයත් ඒකක 9846 ක අතිරික්තයක් ද හඳුනාගෙන තිබූ නමුත්, මේ සම්බන්ධ වගකිව යුතු පාර්ශව හඳුනාගැනීමක් හෝ ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමක් සිදුව නොතිබුණි. මෙදින පැවති භෞතික තොග ශේෂයන් ආරම්භක ශේෂයන් ලෙස ගෙන නව තොග පොතක් ආරම්භ කර පවත්වාගෙන ගොස් තිබුණි. | 2023.03.27 දින දක්වා ගබඩාවෙහි භාරකරු වශයෙන් රාජකාරි කළ කළමනාකරණ සේවා නිලධාරි ටී. බී. එන්. ප්‍රනාන්දු මහතා අත්අඩංගුවට පත්වීම සම්බන්ධයෙන් 2023 ජූලි 11 දින මූලික විමර්ශනයක් ආරම්භකර ඇත. | මනා තොග පාලනයක් පවත්වා ගත යුතු අතර, ඌන හෝ අධිතොග සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශව හඳුනාගෙන ඉදිරි කටයුතු සිදුකළ යුතු ය. |

## 04. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පොලිස් කොට්ඨාශ හා පොලිස් ස්ථානවල රාජකාරි ස්වභාවය පිළිබඳ අධ්‍යනයකින් පසු නිශ්චිතව හඳුනාගත් අනුමත කාර්ය මණ්ඩලයක් නොතිබීම මත එම කොට්ඨාශය හා පොලිස් ස්ථානවල පුරප්පාඩු පවතී ද, අතිරික්තයක් පවතී ද යන්න නිශ්චිතව ප්‍රකාශ කළ නොහැකි විය. මෙම තත්ත්වය තුළ කාර්ය මණ්ඩලය ස්ථානගත කිරීම නිසි ක්‍රමවේදයකින් තොරව ක්‍රියාත්මක වී තිබුණි. | පොලිස් කොට්ඨාස, පොලිස් ස්ථාන හා කාර්යාලවල සිටිය යුතු එක් එක් නිලයෙහි නිලධාරීන් සංඛ්‍යාව තීරණය කිරීම සඳහා ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයෙකුගේ ප්‍රධානත්වයෙන් පර්යේෂණ සහ සංවර්ධන කොට්ඨාසයේ නිලධරයන් ද ඇතුළත්ව කමිටුවක් පත්කර ඇති අතර, එම කමිටු වාර්තාව අනුව ඉදිරි කටයුතු සිදු කිරීමට නියමිතව ඇති බව දන්වා ඇත. | පොලිස් කොට්ඨාශ හා පොලිස් ස්ථානවල රාජකාරි ස්වභාවය පිළිබඳ අධ්‍යනයකින් පසු නිශ්චිතව හඳුනාගත් අනුමත කාර්ය මණ්ඩලයක් අනුයුක්ත කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | පිරිමි පොලිස් කොස්තාපල් තනතුරේ අනුමත සංඛ්‍යාව 60,000 ක් වුව ද, සමාලෝචිත වර්ෂය අවසානයේ තථ්‍ය සංඛ්‍යාව 30,909 ක් වීම මත පුරප්පාඩු 29,091 ක් පැවතුණි. අනුමත සංඛ්‍යාව නොසලකා, 2019 හා 2020 වර්ෂවල ලබාදී තිබූ උසස්වීම් සඳහා අනුමැතිය ලබාදීම හේතුවෙන් පොලිස් සැරයන් තනතුරේ 10,900 ක අතිරික්ත සංඛ්‍යාවක් සිටින අතර, එම සංඛ්‍යාවට අමතරව තවදුරටත් පුරප්පාඩු 18,191 ක් පැවතුණි. මෙය අනුමත සංඛ්‍යාවෙන් සියයට 30 ක් වූ අතර එය ශ්‍රී ලංකා පොලීසියේ අත්‍යාවශ්‍ය මහජන සේවාවන් ඉටු කිරීමේදී බාධාවක් වී තිබුණි. | 2024 වර්ෂයේදී 5000 ක් බඳවාගැනීම සඳහා 2023.08.09 දින යොමු කරන ලද ලිපිය අනුව 2024, 2025 හා 2026 වර්ෂවලදී ආධුනික නිලධරයන් 3800 ක් බඳවාගැනීමට 2024.02.29 දිනැති අංක DMS/1184/Vol-VIII(T) දරන ලිපිය මඟින් අනුමැතිය ලබාදී ඇත. ඒ අනුව අනුමැතිය පරිදි 2024 වර්ෂය තුළ 500 ක් බඳවාගැනීම සඳහා සම්මුඛ පරීක්ෂණ සිදු කරමින් පවතින බව දන්වා ඇත. | අනුමත සංඛ්‍යාවට අදාළ පුරප්පාඩු පිරවීම, උසස්වීම් ලබාදීම සිදුකළ යුතු ය. |
| (ඇ) | කාන්තා පොලිස් කොස්තාපල් තනතුරේ අනුමත සංඛ්‍යාව 10,000 ක් වුව ද, සමාලෝචිත වර්ෂය අවසානයේ තථ්‍ය සංඛ්‍යාව 5,980 ක් පමණක් වීම මත පුරප්පාඩු 4020 ක් පැවතුණි. අනුමත සංඛ්‍යාව නොසලකා 2019 හා 2020 වර්ෂවල ලබාදුන් අනුමැතිය හේතුවෙන් කාන්තා පොලිස් සැරයන් තනතුරේ 645 ක අතිරික්ත සංඛ්‍යාවක් සිටින අතර, එම සංඛ්‍යාව ඉක්මවා කාන්තා පොලිස් කොස්තාපල් තනතුරේ තවදුරටත් පුරප්පාඩු 3,375 ක් පැවතුණි. එය අනුමත සංඛ්‍යාවෙන් සියයට 34 ක් වූ බැවින් සෘජුවම ශ්‍රී ලංකා පොලීසියේ අත්‍යාවශ්‍ය මහජන සේවාවන් ඉටු කිරීමේදී බාධාවක් වී තිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය. | 2024 වර්ෂයේ දී 5000ක් බඳවාගැනීම සඳහා 2023.08.09 දින යොමු කරන ලද ලිපිය අනුව 2024, 2025 හා 2026 වර්ෂවලදී ආධුනික නිලධරයන් 3800 ක් බඳවාගැනීමට 2024.02.29 දිනැති අංක DMS/1184/ Vol-VIII(T) දරන ලිපිය මඟින් අනුමැතිය ලබාදී ඇත. ඒ අනුව ආධුනිකයින් බඳවා ගැනීම් කොට්ඨාසය විසින් අදාළ කටයුතු කිරීමට නියමිතව ඇති බව දන්වා ඇත. | අනුමත සංඛ්‍යාවට අදාළ පුරප්පාඩු පිරවීම, උසස්වීම් ලබාදීම සිදුකළ යුතු ය. |
| (ඈ) | ශ්‍රී ලංකා පොලීසියේ වෛද්‍ය කොට්ඨාශයට අනුයුක්තව පෝෂණවේදී තනතුරේ 2001 වර්ෂයේ සිට වසර 23 ක් ඖෂධ | පෝෂණවේදී තනතුර සහායක සේවා වෘත්තීන් අතරට ඇතුළත්ව නොමැති බැවින්, පෝෂණවේදී | පෝෂණවේදී තනතුරට අදාළ බඳවාගැනීම් කඩිනමින් සිදු කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| | නීතිගත සංස්ථාවට අයත් නිලධාරියෙක් ශ්‍රී ලංකා පොලිස් උපසේවා පදනමින් සේවයේ යොදවාගෙන තිබූ අතර, ඔහුගේ වැටුප් හා දීමනා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව වෙත ප්‍රතිපූරණය කරමින් පැවතුණි. එසේ වුව ද, ශ්‍රී ලංකා පොලීසිය ස්ථිර නිලධාරියෙක් බඳවා ගැනීමට කටයුතු කර නොතිබූ අතර, මෙම තත්ත්වය මත රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවට ද මෙම නිලධාරියාගේ සේවය එම කාලය තුළ අහිමි වී තිබීම ද වෙනත් නිලධාරියෙක් ඒ සඳහා බඳවාගැනීමට ඇති අවස්ථාව අහිමිවීම ද සිදුව තිබුණි. | තනතුර සඳහා බඳවාගැනීමේ හා උසස් කිරීමේ පටිපාටීන් අනුමතකර ගැනීමට සිදුව ඇත. | |
| (ඉ) | ප්‍රාදේශීය පොලිස් කොට්ඨාශ 34 ක් විසින් විගණනයට ලබාදී තිබූ තොරතුරු අනුව වසර 08 සිට 38 දක්වා දීර්ඝ කාලීනව වැටුප් වර්ධක සකස් නොවූ නිලධාරීන් 507 ක් විය. ආරම්භක වැටුප් පියවරේ හෝ වැටුප් වර්ධක දෙක තුනක් පමණක් හිමිව සිටින මෙම නිලධාරීන්ගේ සෙසු වැටුප් වර්ධක නොලැබීමට ප්‍රධාන හේතුව පෙර සේවය කළ පොලිස් ස්ථාන වෙතින් ලැබිය යුතු වාර්තා නොලැබීම මත බව නිරීක්ෂණය විය. මෙම තත්ත්වය තුළ මෙම නිලධාරීන්ට හිමි වැටුප් වර්ධක හා දීමනා නොලැබීම, උසස්වීම් ලැබීමට ඇති අවස්ථා අහිමිවීම හා විශ්‍රාම යාමේදී ගැටළු මතුවීම වැනි තත්ත්වයන් ඇතිවී තිබුණි. | විනය පරීක්ෂණ පැවතීම හා නීතිමය කටයුතු අවසන් නොවීම හේතුවෙන් වැටුප් වර්ධක සකස් නොවූ නිලධාරීන් ද මෙම නිලධාරීන් අතර සිටින බවත්, දීර්ඝ කාලීනව වැටුප් වර්ධක සකස් නොවූ නිලධාරීන් පිළිබඳ විස්තර ලබාගැනීමට කටයුතුකර ඇති අතර, එම නිලධාරීන් සම්බන්ධව වැටුප් වර්ධක සකස් කිරීමට අවශ්‍ය පියවරයන් ගෙන ඇති බව දන්වා ඇත. | වැටුප් වර්ධක සකස් නොවූ නිලධාරීන් සම්බන්ධයෙන් පසුවිපරම් සිදුකර ප්‍රමාද දෝෂයන් වලක්වා ගැනීමට කටයුතු කළ යුතු ය. |
| (ඊ) | ආධුනික ගොනුව අස්ථානගත වීම හෝ ආධුනික ගොනුව සම්පූර්ණ නොකිරීම යන හේතු මත අවුරුදු 8 සිට 38 දක්වා දීර්ඝ කාලයන් තුළ ආධුනික තත්ත්වයේ සිටින පොලිස් | තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් ආධුනික නිලධාරීන්ගේ වැටුප් වර්ධක සකස් කිරීමේදී තනතුරට අදාළ වැටුප් පියවරෙහි පිහිටුවා | දීර්ඝ කාලයන් තුළ ආධුනික තත්ත්වයේ සිටින පොලිස් නිලධාරීන් සම්බන්ධයෙන් කඩිනමින් සුදුසු පියවරගත යුතු ය. |

නිලධාරීන් 88 ක් නිරීක්ෂණය වූ අතර, මෙම නිලධාරීන් පිළිබඳ පත්වීම් බලධරයා දැනුවත්කර සුදුසු පියවරගත් බවට තොරතුරු අනාවරණය නොවුනි. පොලිස් ස්ථාන භාරයේ ඇති ආධුනික ගොනු අස්ථානගත වීම සම්බන්ධයෙන් ද විධිමත් පියවරගත් බවට තොරතුරු නොතිබුණි.

උපයාගත් පළමු වැටුප් වර්ධකය ලබාදීමටත් සෙසු වැටුප් වර්ධක තනතුර ස්ථිර වීමෙන් පසුව ලබාදීමටත් අනුමැතිය ලබාදී ඇති බව දන්වා ඇත.